# තංගල්ල නගර සභාව
## 2025 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.

තංගල්ල නගර සභාවට 2025 වර්ෂය සඳහා පහත සඳහන් සැපයුම් හා සේවාවන් සැපයීම සඳහා ලියාපදිංචි වීමට කැමති දේශීය නිෂ්පාදකයින්, සැපයුම්කරුවන් හා ආයතන වෙතින් අයදුම්පත් භාරගනු ලැබේ. පහත සඳහන් කොන්දේසි වලට යටත්ව සකස් කර ගන්නා ලද අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර 2024.12.30 වන දිනට ප්‍රථම පහත දැක්වෙන ලිපිනයට ලැබෙන පරිදි තැපෑලෙන් හෝ පැමිණ භාරදිය යුතුය. අයදුම්පත් අඩංගු කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2025"** වශයෙන් සටහන් කළ යුතුය.

**01. භාණ්ඩ**

01. ඉලෙක්ට්‍රොනික / විදුලි උපකරණ හා කාර්යාලීය යන්ත්‍රෝපකරණ / පරිඝනක
02. විදුලි භාණ්ඩ හා විදුලි උපාංග (වීථි පහන් සඳහා වූ කොටස් සමඟ)
03. ගෘහ භාණ්ඩ හා කාර්යාලීය ලී බඩු / වානේ උපකරණ
04. ලිපි ද්‍රව්‍ය, අභ්‍යාස පොත්, මුද්‍රිත පෝරම හා ලේඛන වර්ග
05. වාහන අමතර කොටස්, ටයර් ටියුබ් හා බැටරි
06. විෂබීජ නාශක ද්‍රව්‍ය, රසායනික ද්‍රව්‍ය, සනීපාරක්ෂක ද්‍රව්‍ය හා උපකරණ (ගම් බූට්ස්, ග්ලවුස් ඇතුළුව)
07. පුස්තකාල පොත්පත් සඟරා
08. ඉදිකිරීම් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය (ගල්, වැලි, බොරලු, සිමෙන්ති, සෙවිලි ද්‍රව්‍ය, දැව, යකඩ, තීන්ත වැනි)
09. මාර්ග නඩත්තු උපකරණ (තාච්චි, යකඩ, ඉනි, රේක්ක, සවල්, උදළු, වීල්බැරෝ වැනි)
10. නිල ඇඳුම් හා උපකරණ (රෙදි පිළි, ඒප්‍රන්, නිමි නිල ඇඳුම් සැපයීම)
11. සියලුම වර්ගයේ කොහු / රබර් නිෂ්පාදන (ඉදල්, කොසු, බුරුසු, වේවැල් කූඩ)
12. ආදාහනාගාරය සඳහා 37.5 kg ගෑස් සැපයීම.
13. ඡායා පිටපත් යන්ත්‍ර / මුද්‍රණ යන්ත්‍ර / ෆැක්ස් යන්ත්‍ර සඳහා අවශ්‍ය තීන්ත හා ටෝනර්
14. කසළ බඳුන් සැපයීම.
15. ගිනි නිවීමේ ඒකකය සඳහා උපකරණ සැපයීම.

**02. සේවාවන්**

01. සියලුම වර්ගයේ වාහන සේවා කිරීම (බල ප්‍රදේශය තුළ හෝ ඊට යාබදව පිහිටා තිබිය යුතුය)
02. සියලුම වර්ගයේ ඩීසල්, පෙට්‍රල් වාහන අලුත්වැඩියා සහ ටිංකර් පේන්ට් කිරීම, බෝට්ටු එන්ජින්, බොබ්කැට් යන්ත්‍ර, වතුර මෝටර් අලුත්වැඩියාව
03. කාර්යාලීය යන්ත්‍රෝපකරණ (පරිඝනක, ඡායාපිටපත්) අලුත්වැඩියා සහ සේවා කිරීම.
04. වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව හා සේවා කිරීම.
    - රථ වාහන වායු සමීකරණ
    - කාර්යාල වායු සමීකරණ
05. ආහාර පාන සැපයීම.
06. දැන්වීම් / බැනර් / පෝස්ටර් හා සියලු වර්ගයේ මුද්‍රණ කටයුතු, රබර් මුද්‍රා කැපීම.
07. අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම.
08. ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය ලී බඩු උපකරණ අලුත්වැඩියා කිරීම.
09. ආදාහනාගාර අලුත්වැඩියාව හා නඩත්තු කිරීම.
10. වාහන කුලී පදනම මත සැපයීම.
    I. කසළ ප්‍රවාහනය සඳහා ට්‍රැක්ටර් කියුබ් 1.0 -3.5 දක්වා වන ටිපර් රථ කම්පැක්ටර්
    II. JCB මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර බර ඔසවන යන්ත්‍ර
    III. ස්කැවේටර් යන්ත්‍ර
    IV. මාර්ග නඩත්තු යන්ත්‍ර, වතුර බවුසර්, ටිපර් රථ
    V. දෛනික වැටුප මත ශ්‍රමිකයන්

11. බෝතල්, පත්තර, පරණ යකඩ හා අබලි ද්‍රව්‍ය මිලදී ගැනීම.

12. ඇලුමිනියම් උපාංග යොදා දොර ජනෙල් සෑදීම, ඉදිකිරීම් හා වෙන් කිරීම් සිදු කිරීම.

13. ටයර්, ටියුබ් මාරු කිරීම , පැච් දැමීම, වීල් එලයිමන්ට් කිරීම, හිස් ටයර් නැවත පිරවීම.

14. කාර්යාලීය හැඳුනුම්පත් සැකසීම හා ඡායාරූප සේවා

15. නිල ඇඳුම් මැසීම

16. නීතිඥ සේවා සැපයීම.

17. ගිනි නිවීමේ උපකරණ නඩත්තුව හා සේවා සැපයීම.

**03. කොන්ත්‍රාත්**

01. මාර්ග ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන්

රුපියල් මිලියන $\left\{ (C6) - 25 \geq X > 10, (C7) - 10 \geq X > 5, (C8) - 5 \geq X > 2, (C9) - 2 \geq X \right\}$

02. ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන්

රුපියල් මිලියන $\left\{ (C6) - 25 \geq X > 10, (C7) - 10 \geq X > 5, (C8) - 5 \geq X > 2, (C9) - 2 \geq X \right\}$

**කොන්දේසි :**

01. අයදුම්පත්‍රය සමඟ සියලු විස්තර ඇතුලත් කර ලේකම්, තංගල්ල නගර සභාව, තංගල්ල යන නමට ලියන ලද චෙක්පතක් හෝ මෙම කාර්යාලයේ සරප් වෙත මුදල් ගෙවා ලබාගත් ලදුපතක් සමඟ ඉදිරිපත් කළ යුතුය.

02. ඉහත සඳහන් එක් එක් අයිතමය සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, සෑම අයදුම්පතක් සඳහාම ලියාපදිංචි ගාස්තු වශයෙන් රු. 1000.00 ක මුදලක් ගෙවිය යුතුය.

03. සියලු අවශ්‍යතා සඳහා සාමාන්‍යයෙන් ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවල ඉන් බාහිරවද මිල ගණන් කැඳවීමේ හා මිලදී ගැනීමේ අයිතිය සභාව සතුවේ.

04. ඉදිරිපත් කර මිල ගණන් අවම වශයෙන් මාස 06 ක කාලයකට නොවෙනස්ව පවත්වාගත යුතු අතර. අවම වශයෙන් දින 30 ක කාලයකට ණය බිල්පත් මත භාණ්ඩ හා සේවාවන් සැපයීමට එකඟ විය යුතුය.

05. නිසි පරිදි මිල ගණන් ඉදිරිපත් නොකරන, කලට වේලාවට භාණ්ඩ හා සේවා නොසපයන ප්‍රමිතීන්ට හා ආදර්ශයන්ට අනුකූලව භාණ්ඩ හා සේවා නොසපයන සැපයුම්කරුවන් ලේඛනයෙන් ඉවත්කර අසාධු ලේඛන ගත කරනු ලැබේ.

06. වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළ පැමිණ හෝ දුරකථන අංක 047-2240275 අමතා ලබා ගත හැක.

07. පහත සඳහන් නිර්ණායකවල පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

**සැපයුම්කරුවන් සඳහා තිබිය යුතු නිර්ණායක :**

01. සංස්ථාවක් නම් සංස්ථාවක් ලෙස නීතිගත කළ බවට දෙන සහතිකය.

02. තනි පුද්ගල ව්‍යාපාරයක් නම් ලියාපදිංචි කිරීමේ සහතිකය

03. සමාගමක් නම් සමාගම් පනත අනුව ලියාපදිංචි කිරීමේ සහතිකය.

04. කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා ඉදිකිරීම් පුහුණු කිරීම් හා සංවර්ධන (ICTAD) ලියාපදිංචි සහතිකය හා පොත (අවශ්‍යතාවය පරිදි) ඉදිරිපත් කළ යුතුය.

05. මීට පෙර රාජ්‍ය ආයතන පහකටවත් භාණ්ඩ හා සේවා සපයා තිබීම විශේෂ සුදුසුකමක් වේ.

06. වාහන අලුත්වැඩියා සම්බන්ධයෙන් දකුණු පළාත් සභාවේ අනුමත මෝටර් ගරාජයක් වීම හා රාජ්‍ය ආයතන පහකටවත් සේවා සපයා ඇති පළපුරුදු ආයතනයක් වීම විශේෂ සුදුසුකමකි.

07. වගකීම් කාලයක් ඇති භාණ්ඩ හා සේවා සඳහා වගකීම් කාලය සඳහන් විය යුතුය.
විශේෂ සුදුසුකම් ඇත්නම් සඳහන් කරන්න.

ලේකම්,
තංගල්ල නගර සභාව